ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. DRP/OP/10/15/03

ඔබේ අංකය / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.07.15

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්,

සියලුම ග්‍රාම නිලධාරීන් හා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් වෙත,

**<u>එක්දින සේවය වෙත ඉල්ලුම්කරුවන් යොමු කිරීම සම්බන්ධවයි.</u>**

එක්දින සේවයෙන් ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත සෑම ප්‍රදේශයක සිටම ඉල්ලුම්කරුවන් පැමිණේ.එම ඉල්ලුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත ප්‍රමාදයකින් තොරව ලබා දීමට අප දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර ඒ සම්බන්ධයෙන් ඔබ විසින් ලබාදෙන සහයෝගය ද ඉතා අගය කොට සලකමි.

02. එනමුත්, එක්දින සේවය මගින් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ඉල්ලුම්කරුවන්ට වඩාත් ඵලදායි සේවයක් ලබා දීමටත් කඩිනමින් ජාතික හැඳුනුම්පත ඉල්ලුම්කරු හට ලබා දීමටත් කටයුතු කිරීමේදී හඳුනාගත් ගැටළු පහත පරිදි වේ.

1. ඉල්ලුම්කරුවන් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන නොමැතිව එක්දින සේවය වෙත යොමු වන අවස්ථා ඇති අතර එවැනි අවස්ථා වලදී නැවත ප්‍රාදේශීය ලේකම් අනු අත්සන ලබාගෙන එන ලෙසට ඉල්ලුම්කරුවන් හරවා යැවීමට සිදු වේ.
2. ඉල්ලුම්පතෙහි ලිපිනය සඳහන් කිරීමේදී සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලි අකුරින් සඳහන් කළ යුතු බව දන්වා ඇතත් (DRP/OP/01/DS/03 (වෙළුම IV) හා 2023.12.23 දිනැති ලිපිය) එසේ නොවන අවස්ථා නිරීක්ෂණය වී ඇති අතර සමහර අවස්ථා වලදී භාෂා ද්විත්වයෙන් සඳහන් කරන ලිපිනයන් වෙනස් වන අවස්ථා ද දක්නට ඇති අතර එවැනි අවස්ථාවල නැවත ලිපිනය තහවුරු කර ගැනීමට ග්‍රාම නිලධාරී සම්බන්ධ කර ගැනීමට සිදුවීම මගින් ඉල්ලුම්කරු අපහසුතාවයට පත් වේ.
3. තවද, එලෙස සඳහන් කරන ලද ලිපිනයන්හි සංශෝධනයන් සිදු කර ඇති විටකදී ඉල්ලුම්පත සහතික කිරීමට පෙර එම සංශෝධනය කරන ලද ස්ථානයේ ග්‍රාම නිලධාරී විසින් තම අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතු බවත් දන්වා ඇති අතර එසේ නොවන අවස්ථා වලදී ඉල්ලුම්පත සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකළ නොහැකි වී ඇත.

03. ඒ අනුව, ඉහත සඳහන් කරන ලද සෑම අවස්ථාවකදීම ඉල්ලුම්කරුවන් දැඩි අපහසුතාවයකට පත් වන අතර දෙපාර්තමේන්තු නිලධාරීන්ටද බාධාවකින් තොරව තම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී ඇත.එබැවින්, දෙපාර්තමේන්තුව වෙත යොමු වන මහජනතාවට අපහසුතාවයකින් තොරව තම අවශ්‍යතාවයන් ඉටු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම අපගේ වගකීමක් වේ. ඔබද එම වගකීමේ පාර්ශවකරුවන් වන බැවින් ඉහත ගැටළු මගහරවාගෙන වඩාත් ඵලදායී සේවයක් සැපයීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**එම්.එස්.පී සූරියප්පෙරුම**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ )

පිටපත්

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
02. ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
03. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස
04. විගණකාධිපති - කරු.දැ.ගැ.ස

දුරකථන / தொலைபேசி / Telephone (011) 5226100
ෆැක්ස් / பெக்ஸ் / Fax (011) 2862198
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail info@drp.lk
වෙබ් / இணையதளம் / Web www.drp.gov.lk